# මාතර ප්‍රාදේශීය සභාව
# මාතර දිස්ත්‍රික්කය

---------------------------

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 26 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජුලි 10 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට මාතර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර වත්කම් මිළදී ගැනීමට සහ ඉදිකිරීමට වැයකර තිබුණු රු.3,473,612 ක් අදාල ගිණුම්වලට හර කර ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම බැර කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේදී කර්මාන්ත වෙනුවෙන් සාමාන්‍ය ගිණුමට රු.600,000 ක් මාරු කිරීම කර්මාන්ත ගෙවීම් මුදල් පොතේ සටහන් නොකිරීමේ වරද නිවැරදි කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී එකී මුදල් පොත බැරකර සමුච්චිත අරමුදල හර කළයුතු වුවද, ප්‍රාග්ධන වැය 309 ශීර්ෂයට හර කර වර්ෂයේ ප්‍රාග්ධන වැය එකී මුදලින් වැඩිපුර දක්වා තිබුණි.

(ඇ) විදුලි උපකරණ තොග ලේඛනය අනුව 2014 දෙසැම්බර් 31 දිනට සීඑෆ්එල් පහන් ප්‍රමාණය 41 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන සමග දී ඇති තොග උපලේඛනය අනුව පහන් 71 ක් විය. ඒ අනුව වැඩිපුර දක්වා තිබූ පහන් 30 ක වටිනාකම රු.14,850 ක් විය.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම

සමාලෝචිත වර්ෂය අවසානයට ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 03 කට අදාලව වටිනාකම රු.29,327,169 ක් වූ අතර උපලේඛන අනුව වටිනාකම රු.9,041,301 ක් වූයෙන් වෙනස රු.20,285,868 ක් විය

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.46,127,283 ක් විය.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 24,600,025 ක් විය.

1.3.4 නිරවුල් නොකළ ගිණුම් ශේෂ

ඉකුත් වර්ෂවල සිට ඉදිරියට ගෙන එමින් පවතින රු. 25,194,739 ක් වූ ගිණුම් ශේෂයන් 10 ක් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන රු.175,134,043 ක් වටිනා ගිණුම් විෂයයන් 13 කට අදාල සමීක්ෂණ වාර්තා, ආයෝජන ලේඛන, ස්ථාවර තැන්පතු සහතික, ශේෂ සහතික, සහ උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

1.3.6 නීති, රීති , රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති<br>රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්තතා හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිසනක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,009,842 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,421,332 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයයන් | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් බදු, අක්කර බදු | 521 | 324 | 873 |
| කුලී | 2,480 | 1,345 | 385 |
| බලපත්‍ර ගාස්තු | 1,090 | 1,418 | 29 |
| වෙනත් ආදායම් | 59,292 | 49,184 | 34,246 |

2.2.2 වරිපනම් බදු

2014 ජනවාරි 01 දිනට හිඟ වරිපනම් බදු වටිනාකම රු.818,000 ක් වූ අතර වර්ෂය තුල බිල්කිරීම් අධි ගාස්තු සමඟ රු.325,843 ක් විය. වර්ෂය තුල ලැබීම් රු.283,284 ක් වූයෙන් අයවීමේ ප්‍රගතිය සියයට 24 ක් විය. 2014 දෙසැම්බර් 31 දිනට හිඟ වටිනාකම රු.862,469 ක් වූ අතර වාර්ෂිකව හිඟ මුදලේ වර්ධනයක් දක්නට ඇති හෙයින් ආදායම් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය අනුව ආදායම් අයකිරීමේ බලධාරියා වන සභාවේ ලේකම්වරයාගේ අවධානය යොමුවී නොමැති බව නිරික්ෂණය විය.

2.2.3 අක්කර බදු

2014 ජනවාරි 01 දිනට හිඟ අක්කර බදු මුදල රු.12,419 ක් වූ අතර වර්ෂයේ බිල්කිරීම් රු.3,280 ක මුදල සමඟ රු.15,699 ක් අයවිය යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂයේ රු.5,004 ක් පමණක් අයකර ගෙන තිබුණෙන් අයවීමේ ප්‍රගතිය සියයට 32 ක් විය.

2.2.4 කුලී ආදායම්

2014 ජනවාරි 01 දිනට හිඟ කුලී මුදල රු.393,262 ක් වූ අතර වර්ෂය තුල බිල් කිරීම් රු.1,053,769 ක මුදල සමඟ රු.1,447,231 ක් අයවිය යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂයේදී අයකරගත් මුදල රු.982,050 ක් වූයෙන් අයවීමේ ප්‍රගතිය සියයට 68 ක් විය.

2.2.5 ඉඩම් අනුබෙදුම් ගාස්තු

වැව ඉහලගොඩ පොල්අඹෙහේනවත්ත නමැති ඉඩම 2011 ජුනි 27 දිනැති පිඹුරු අංක 898 දරන කැබලි සැලැස්ම මගින් ඉඩම් කැබලි 7 කට වෙන්කර තිබුණද එකී සැලැස්ම සභාව අනුමත කර නොතිබුණි. ඒ අනුව 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන නාගරික සංවර්ධන අධිකාරියේ ගැසට් පත්‍රය පරිදි අනවසර අනු බෙදුම වෙනුවෙන් රු.5,250 ක්ද සියයට 1 ක ඉඩම් විකිණීමේ බද්ද ලෙසට රු.18,650 ක මුදලක්ද අයකර ගෙන නොතිබුණි.

2.2.6 ඉඩම් විකුණුම් බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය පරිදි ඉඩම් විකුණුම්කාර තැනැත්තන්ගෙන් ඉඩමේ විකුණුම් පිරිවැයෙන් සියයට 1 ක බද්දක් අයකර ගත යුතු වුවද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වෙන්දේසියේ විකුණන ලද ඉඩම් 17 කට අයත් ඉඩම් කැබලි 397 කින් අයවිය යුතු එකී බද්ද අයවී නොතිබුණි.

2.2.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (අ) | උසාවි දඩ | 1,016,900 |
| (ආ) | මුද්දර ගාස්තු | 20,000,000 |

3. මෙහෙයුම් සමාලෝචනය
---------------------------

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

3.1.1 ස්ථාවර වත්කම් සමීක්ෂණය.
--------------------------------

(අ) 2014 අගෝස්තු 22 දිනැති අංක 06.7 (1) තීරණය පරිදි සමීක්ෂණ මණ්ඩලයක් පත්කර සභාව සතු ස්ථාවර වත්කම් සමීක්ෂණය කර තිබූ අතර 2014 නොවැම්බර් 21 දිනැති සභාව මගින් එකී වාර්තාවේ නිර්දේශ 11 ක් ක්‍රියාත්මක කිරීමට තීරණය කර තිබුණද පහත සඳහන් නිර්දේශ 2015 මැයි 15 දින වන විටත් ක්‍රියාත්මක වී නොතිබුණි.

- (i) සභා දේපල වල අනවසරයෙන් පදිංචි පුද්ගලයින් සඳහා නීතිමය පියවර ගැනීම
- (ii) සභා දේපල මැන මායිම් සකස් කර නාම පුවරු සවි කිරීම
- (iii) සභාව සතු දේපල වලට ඔප්පු සකස් කිරීම
- (iv) සභාවේ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරිම
- (v) සභාව සතු මුඩු ඉඩම් ඵලදායි කටයුත්තක යෙදවීම.

(ආ) පහත සඳහන් වත්කම් සම්බන්ධයෙන් නිරීක්ෂණය වී ඇති කරුණු මෙසේය.

- (i) සභාවේ ප්‍රධාන කාර්යාලය පිහිටි පර්චස් 25 ක ඉඩමට අදාල ඔප්පුවක් හෝ පිඹුරු සැලැස්මක් නොතිබුණි.
- (ii) ඉලුක්මණ්ඩිය බිම් කොටස - පිඹුරු අංක 270 සැලැස්ම අනුව නාවිමන උතුර ප්‍රජා ශාලාව පිටුපස වූ පර්චස් 2 ක බිම් කැබැල්ල භෞතිකව සොයා ගත නොහැකි වී තිබුණි.
- (iii) මාකාවිට දිරච්චියවත්ත පොදු ළිඳ පිහිටි ඉඩම භෞතිකව සොයාගත නොහැකි වී තිබුණි.
- (iv) තල්පාවිල උතුර මොන්ටලික්ස්වත්ත - පිඹුරු අංක 65/2008 බිම් සැලැස්මට අයත් රූඩ් 1 පර්චස් 8.05 ක් වූ අංක 50 දරන බිම් කැබැල්ල, වාල්ස්වත්ත (වින්ස්ටන් පාර්ක්) අංක 59/2006 බිම් සැලැස්මේ ඔප්පු අංක 10750 මගින් ලැබී තිබූ කැබලි අංක 40, 41, 42, 43 සහ 44 ට අයත් පර්චස් 62.72 ක ඉඩම් කොටස් 05 ක් සහ වාල්ස් වික්වත්ත, පිඹුරු අංක 37ඒ/2010 බිම් සැලැස්ම මගින් පොදු කටයුතු සඳහා ලැබී තිබූ කැබලි අංක 07, 08, 09, 10 සහ 29 ට අයත් පර්චස් 66.14 ක ප්‍රමාණයේ ඉඩම් කොටස් පහක් භෞතිකව සොයාගත නොහැකි විය.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය
--------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මාතර ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලය අභ්‍යන්තරය පුළුල් කිරීමට රස්සන්දෙණියේ ගොවි සමිතියක් සමඟ පළමු අදියර සඳහා 2014 ජනවාරි 30 දිනැතිව රු.124,445 ක් වටිනා ගිවිසුමක්ද දෙවන අදියර සඳහා 2014 පෙබරවාරි 24 දිනැතිව රු.441,734 ක්ද වටිනා ලෙසට රු.566,179 ක ගිවිසුම් අත්සන් කර 2014 මාර්තු 26 දින රු.557,294 ක මුදලක් ගෙවා තිබීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) 2014 වර්ෂය සඳහා සභාවට ඉදිරිපත් කළ අයවැය ලේඛනය 2013 දෙසැම්බර් 13 දිනැති විශේෂ මහා සභාවේදී අනුමත වී නොතිබුණි. එහෙයින් 2014 ජනවාරි 02 දිනැති අංක 1843/35 දරන ගැසට් පත්‍රයෙන් කරන ලද නියමය පරිදි මාතර පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ 2014 ජනවාරි 06 දිනැති ලිපියෙන් අනුමත කර තිබූ අයවැය ලේඛනයේ සභා ප්‍රධාන කාර්යාලයේ අභ්‍යන්තරය පුළුල් කිරීම සඳහා මුදල් ප්‍රතිපාදන සලසා නොතිබූ අතර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 174(iv) උප වගන්තිය පරිදි කටයුතු සිදුව නොතිබුණි.

(ii) මෙම කර්මාන්තය සම්බන්ධයෙන් 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 171 ක පරිදි ඇස්තමේන්තු ලෙජරයක්, මිණුම් පොතක්, නඩත්තු නොකිරීම, රීති 177 පරිදි කොන්ත්‍රාත් සම්බන්ධයෙන් කටයුතු නොකිරීම, රීති 178 (3)(1) පරිදි සීමිත ටෙන්ඩර් කැඳවීමකදී අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග නොගෙන ගිවිසුම්කාර ගොවි සමිතියට කර්මාන්තය ඉටුකිරීම පැවරීම, රීති 178 (3)(2) පරිදි ගිවිසුම්කාර ගොවි සමිතිය සම්බන්ධ යෝග්‍යතා සහතිකයක් ලබා ගැනීම යනාදිය සිදුව නොතිබුණි.

(iii) පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2000 ජුලි 13 දිනැති අංක 7/4/2000 දරන චක්‍රලේඛයේ රීති 177 පරිදි කටයුතු නොකරන අවස්ථාවන්හිදී පළාත් පාලන කොමසාරිස් හෝ නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස්, නීතිය ක්‍රියාත්මක කළයුතු බව දක්වා ඇතත් එය සිදුව නොතිබුණි.

(ආ) සභා ගර්භය වෙනම කොටසක් ලෙස පවත්වාගෙන යාමට සකස් කිරීම සඳහා
ද්‍රව්‍ය හා උපකරණ ලබා ගැනීම සඳහා මුදල් ගෙවීම

---

සභාවේ සභා ගර්භය වෙනම කොටසක් ලෙස පවත්වාගෙන යාමට 2014 නොවැම්බර් 21 දිනැති මහා සභාවේ තීරණයක් මගින් රු.415,270 ක ඇස්තමේන්තුව පිළිගැනීමටත් සෘජු ශ්‍රම පදනම යටතේ ඉටු කිරීමටත් මුදල් ප්‍රතිපාදන 2014 අයවැය යෝජනා යටතේ ලබා ගැනීමටත්, කම්කරු ශ්‍රමය සඳහා දිස්ත්‍රික් මිළ කමිටු අනුමත කර ඇති පරිදි ගෙවීම් කිරීමටත් තීරණය කර තිබුණි. ඒ අනුව ද්‍රව්‍ය හා උපකරණ ලබා ගැනීම සඳහා සමාගමකට 2014 දෙසැම්බර් 29 දින රු.423,915 ක මුදලක් සහ සේවකයින් 5 දෙනෙකුට 2015 ජනවාරි 27 දින රු.117,000 ක් ලෙසට එකතුව රු.540,915 ක් ගෙවා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 වර්ෂය සඳහා සභාවට ඉදිරිපත් වූ අයවැය ලේඛනය 2013 දෙසැම්බර් 13 දිනැති විශේෂ මහා සභාවේදී අනුමත වී නොතිබුණි. දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ 2014 ජනවාරි 02 දිනැති අංක 1843/35 දරන ගැසට් පත්‍රයෙන් කරන ලද නියමය පරිදි මාතර පළාත් පාලන කොමසාරිස්ගේ 2014 ජනවාරි 06 දිනැති ලිපියෙන් අනුමත කර තිබූ අයවැය ලේඛනයේ මෙම කර්මාන්තය සඳහා ප්‍රතිපාදන ද සලසා නොතිබුණි.

(ii) සභා තීරණයේ සඳහන් රු.415,270 ක ඇස්තමේන්තුව, වැඩ විස්තර හා මිණුම් වාර්තා සහිත එකක් නොවූ අතර වැඩයට අදාල සැලැස්මක්ද නොවීය.

(iii) මිලදී ගන්නා ලද රු.158,932 ක් වටිනා භාණ්ඩ හා උපකරණ වර්ග 32 ක් භාවිතා නොකොට ඉතිරිව තිබුණි.

(iv) 2014 නොවැම්බර් 21 දිනැති සභා තීරණය පරිදි සභා ගර්භය සඳහා රු. 415,270 ක ඇස්තමේන්තුවක් අනුමත කර තිබුණද එකී අනුමත ප්‍රමාණය ඉක්මවා රු.540,915 ක් වැයකර තිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

2014 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| තෘතියික | 01 | 01 | - | - |
| ද්විතියික | 30 | 27 | 03 | - |
| ප්‍රාථමික | 58 | 51 | 07 | - |
| වෙනත් (අනියම්,තාවකාලික, කොන්ත්‍රාත්) | - | 02 | - | 02 |
| එකතුව | 89 | 81 | 10 | 02 |

සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන කොමසාරිස් වෙතින් කාර්යය මණ්ඩල වැටුප් හා මන්ත්‍රී දීමනා සඳහා රු.19,494,800 ක මුදලක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර වර්ෂයේ වැටුප් හා සභික දීමනා ලෙස රු.24,861,954 ක මුදලක් ගෙවා තිබූ හෙයින් සභා අරමුදලෙන් රු.5,367,154 ක් වැයකර තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

(අ) 2014 වර්ෂය වෙනුවෙන් සභාව ඉදිරිපත් කර තිබුණු අයවැය ලේඛනය 2013 දෙසැම්බර් 13 දිනැති මහා සභාවේදී අනුමත වී නොතිබුණෙන් පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ 2014 ජනවාරි 02 දිනැති අංක1843/35 දරන ගැසට් පත්‍රයෙන් හා2014 ජනවාරි 06 දිනැති මාතර පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ ලිපියෙන් අයවැය ලේඛනය අනුමත කර තිබුණි.

(ආ) අයවැය ලේඛනයට සභා බල ප්‍රදේශයේ සිතියම, සංවිධාන සටහන, ආදායම් හා වියදම් පිළිබඳ සැසඳීමේ ප්‍රස්ථාර හා සභාව සතු වත්කම් වගකීම් තොරතුරු ඇතුළත්ව නොතිබුණි. අයවැය සකස් කිරීමට ප්‍රථම මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම, සභා බල ප්‍රදේශයේ ස්වේච්ඡා සංවිධාන, සුභ සාධන සමිති රාජ්‍ය, රාජ්‍ය නොවන ආයතනවල අදහස් හා යෝජනා ලබා ගැනීම සිදුව නොතිබුණි.

(ඇ) අයවැය ලේඛනයේ ප්‍රාග්ධන වියදම් සාරාංශයේ විමධ්‍යගත, පළාත් නිශ්චිත, පළාත් සභා උපමාන පාදක, ගමනැඟුම, මඟ නැඟුම හා සභා අරමුදල් මගින් ඉටු කිරීමට ඉලක්ක කළ කර්මාන්තවල ලැයිස්තුවක් නොවූ අතර එලෙස අයවැය ලේඛනයේ සඳහන් නොවූ ඉදිකිරීම් කර්මාන්ත 33 ක් සඳහා රු.14,766,650 ක මුදලක් වැයකර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු අයවැය ලේඛනයෙහි ආදායම් හා වියදම් සම්බන්ධ සැලකියයුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

4.2 මාසික සහා රැස්වීම් වාර්තා
-----------------------------

1989 අප්‍රේල් 17 දිනැති අංක 554/5 දරන ගැසට් පත්‍රයෙන් ස්ථාපිත ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 177 පරිදි සභාවේ පූර්ව අනුමැතියකින් තොරව රු.5,000 ට වැඩි ගෙවීම් අනුමත කිරිමට නොහැකි වුවද එකී සීමාවන් ඉක්මවා මුදල් ගෙවීමේ බලය 2014.04.22 දිනැති සභා තීරණයක් මගින් සභාපතිවරයාට පවරා ගෙන තිබුණි.

5. පද්ධති හා පාලනය
---------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කළයුතුව ඇත.

(අ) ගිණුම්කරණය
(ආ) ස්ථාවර වත්කම්
(ඇ) ආදායම් පාලනය
(ඈ) ගබඩා පරිපාලනය
(ඉ) අයවැය පාලනය